# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 630/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 12/04/2024 පැය 1025

**මාධ්‍ය නිවේදනය**

**සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් 10 ක් සහ තවත් සැකකරුවන් 07 දෙනෙකු අත්අඩංගුවට - කළුතර, ගාල්ල,කොළඹ, බස්නාහිර පළාත් දකුණ හා බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාස.**

2024.03.19 වන දින සිට බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කර ගෙන ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි විශේෂ පොලිස් කණ්ඩායම් 20 ක් යොදවා මෙහෙයුම් ආරම්භ කරන ලදී. මෙම මෙහෙයුමට සම්බන්ධ බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය, කොළඹ අපරාධ කොට්ඨාසය හා කළුතර අපරාධ කොට්ඨාසයේ විශේෂ පොලිස් කණ්ඩායම් විසින් පහත වැටලීම් සිදු කර ඇත.

1. 2024.04.11 වන දින බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ගම්පහ පොලිස් වසමේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන මාකෙවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

2. 2024.04.11 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් මට්ටක්කුලිය පොලිස් වසමේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

3. 2024.04.11 වන දින බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් බෙම්මුල්ල පොලිස් වසමේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන උඩුගම්පල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

4. 2024.04.11 වන දින බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් අතුරුගිරිය පොලිස් වසමේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන අතුරුගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

5. 2024.04.11 වන දින බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ගල්කිස්ස පොලිස් වසමේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

6. 2024.04.11 වන දින කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් කැස්බෑව පොලිස් වසමේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන තල්විට ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

7. 2024.04.11 වන දින කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් මතුගම පොලිස් වසමේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 850 සමඟින් අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන මතුගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

8. 2024.04.11 වන දින කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ගල්කිස්ස ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

9. 2024.04.11 වන දින ගාල්ල දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ගොණපිනුවල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 වන ගෝණපිනුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

10. 2024.04.11 වන දින ගාල්ල දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් මීටියාගොඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

    **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 වන ගෝණපිනුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

ඉහත අත්අඩංගුවට ගන්නා ලද අපරාධ කල්ලි සාමාජිකයින් 10 ට අමතරව ඔවුන් සමඟ විවිධ සම්බන්ධතා පවත්වමින් අපරාධවලට සහය දැක්වූ බවට සැක කරන තවත්

සැකකරුවන් 07 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. **ඒ අනුව 2024.04.11 වන දින සැකකරුවන් 17 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**මෙම මෙහෙයුම් ආරම්භ කරන ලද 2024.03.19 වන දින සිට 2024.04.11 වන දින දක්වා සමස්ථ සැකකරුවන් හා සැකකාරියන් 393 අත්අඩංගුවට** ගෙන ඇති අතර, සංවිධානාත්මක අපරාධ සිදු කිරීම සඳහා ඍජුවම සහය දැක්වීම්, අපරාධ සැලසුම් කිරීම හා එම අපරාධ වලට ආධාර අනුබල දීම ආදී විවිධාකාරයෙන් සහය ලබා දුන් සැකකරුවන් හා සැකකාරියන් මේ අතර වේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය, ගාල්ල අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය සහ කළුතර අපරාධ කොට්ඨාසය මඟින් රැඳවුම් නියෝග ලබා ගෙන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**